පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - නර්තනය

ශ්‍රේණිය - 8

සතිය- 3


Prepared by- ඩයනා පුෂ්පරාණී මිය

කලාප අධ්‍යාපන කාර්යාලය - ඇඹිලිපිටිය



Department of Education,Sabaragamuwa Province/ Weekly School


## 3.0 සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ

### 3.1 සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ

#### පහතරට බෙරය

පහතරට නර්තන සම්ප්‍රදායයේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය පහතරට බෙරයයි. යක් බෙරය, රුහුණු බෙරය, දෙවොල් බෙරය, දික් බෙරය, සෝෂක බෙරය යන විවිධ නම්වලින් ද හැඳින්වේ. යක් තොවිල්වලට යොදා ගන්නා බැවින් යක් බෙරය ලෙසත්, දෙවොල් මඩුවට යොදා ගන්නා බැවින් දෙවොල් බෙරය ලෙසත්, රුහුණු ප්‍රදේශයේ භාවිත කරන බැවින් රුහුණු බෙරය ලෙසත්, මහා ඝෝෂාකාරී ශබ්දයක් ඇති බැවින් ඝෝෂක බෙරය ලෙසත් දිගටි ස්වරූපයෙන් ඇති බැවින් දික් බෙරය ලෙසත් මෙය හඳුන්වනු ලැබේ.

පහතරට බෙරය සකස් කිරීම සඳහා යොද ගන්නේ අරටු සහිත ශක්තිමත් ගස්වල කඳන්ය. පොල්, කිතුල්, ඇහැළ, කොහොඹ හා කොස් වැනි ශාක මේ සඳහා වඩාත් සුදුසු ය. සාම්ප්‍රදායික ක්‍රමය අනුව බෙර කඳෙහි දිග තුන් වියත් තුනඟුලකි. ඉන් අදහස් කෙරෙන්නේ වාදන ශිල්පියාගේ අතින් වියත් තුනකුත් ඇඟිලි තුනක ප්‍රමාණය යි. බෙර මුහුණතෙහි විෂ්කම්භය අඟල් 9ක් හෝ 10ක් හෝ පමණ වේ.

හැක්ම, වෙනිවර හා වරපටි සඳහා හරක් හම් යොදා ගනී. වරපටි අඟල් 1/4ක පමණ සිහින් විය යුතු ය. බෙර ඇස සඳහා යොදා ගන්නේ හරක් බොක්කේ සිවිය වේ.

පහතරට බෙරයේ දෙපසට යොදන බෙර සිවිවල සුළු වශයෙන් වෙනස්කම් ඇති අතර හයි තට්ටුවට තරමක් සවිමත් සිවියක් යොදා ගැනේ. එය බෙරයේ වම් පැත්ත ලෙසත් දකුණු පැත්ත සුරල් තට්ටුව හෙවත් පෙරළන පැත්ත ලෙස හැඳින්වේ. බීජාක්ෂර වැයීමේ දී තත්, තොං යන අක්ෂර හයි තට්ටුවෙන් ද දිත්, නං යන අක්ෂර සුරල් තට්ටුවෙන් ද වාදනය කෙරේ.

.




වාදන අවස්ථා :

- පහතරට ශාන්ති කර්මවල දී ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ලෙස යොදා ගැනීම.
- මඟුල් බෙර වාදනය
- වැදුම් අත්, දකුම් අත්, තාලම්, සවුදම්, සුරල් වාදනය
- ශාන්ති කර්ම අවසානයේ දී කෙරෙන පින් බෙර වාදනය
- පෙරහැර

පැවරුම

**පහත දක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

1. පහතරට බෙරය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
2. යොදා ගන්නා අමුද්‍රව්‍ය නම් කරන්න.
3. බෙරයෙහි රූප සටහනක් ඇඳ කොටස් නම් කරන්න.